
# 5.1 වෛරී ප්‍රකාශ සමාජගත වීම කෙරෙහි බලපාන කරුණු

## වෛරී ප්‍රකාශයන් සමාජගත වීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු අංශ 06කි.



# 6. සමාජ මාධ්‍යය තුළ වෛරී ප්‍රකාශන දුටු විට ඔබ කළ යුත්තේ කුමක්ද?

## 6.1 බෙදා නොගන්න.....

ඔබ සමාජ මාධ්‍ය තුල වෛරී ප්‍රකාශනයක් කියවන්නේ නම් හෝ වීඩියෝ පටයක් නැරඹුව-හොත් එය ඔබව අපහසුතාවයකට පත් කරන්නේ නම් හෝ එහි අන්තර්ගතය වෙනත් ආරක්ෂිත පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට හානි කරන්නේ යැයි ඔබට දැනෙන්නේ නම්,

**එය, බෙදා ගන්න එපා......**

අවම වශයෙන් සමීප කණ්ඩායමක් සමගවත් විවේචනය කිරීමක් / බෙදා ගැනීමක් කරන්න එපා.

මක් නිසාදයත්, එබඳු හුවමාරු කරගැනීමක් තුළ ඔබ අපේක්ෂා නොකරන මට්ටමකින් ඒ සඳහා ප්‍රේක්ෂක අවධානයක් ලබා දිය හැකි බැවිනි. ඒබඳු පොස්ට් වලට අවධානය ලබා ගැනීමේ සම්භාවිතාව ඉහල මට්ටමක් ඇති බව මතක තබා ගන්න.

## 6.2 තහවුරු කරන්න...

ඔබ දකින පොස්ට් ඒකේ අන්තර්ගතයේ සත්‍යතාව ගැන ඔබට විශ්වාසයක් නැත්නම් එහි නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා එහි ඇති තොරතුරු ගූගල් කළ හැකිය. එසේම ඔබට නැවත නැවත තොරතුරු සොයා ගැනීම තුළින් පෝස්ට් එකේ සත්‍ය අසත්‍යතාව පිළිබඳ නිගමනයකට පැමිණිය හැකිය.

## 6.3 වාර්තා කරන්න...

සෑම සමාජ මාධ්‍ය වේදිකාවටම තමන්ගේම වාර්තාකරණ යාන්ත්‍රණයක් ඇත. මෙවැනි යාන්ත්‍රණවල සාර්ථකභාවය ගැන සැක මතු වුවද, එහි අන්තරගතය පිළිබඳ වාර්තා කිරීමේ වගකීම අපට ඇති බව මතක තබා ගත යුතුය. අප විසින් වාර්තාකරණ අගයන් වැඩි කිරීම තුළ සමාජ මාධ්‍ය සමාගම් වලට සිදු කරන අනතුරු ඇඟවීම ඉහල යන අතර එය වෛරී ප්‍රකාශ සම්බන්ධ ක්‍රියාකාරකම් පහත හෙළිමටද ඔවුන් දිරිමත් කරනු ඇත.

## 6.4 පිළියම් යොදන්න...

වෛරී ප්‍රකාශන කිරීම වරදක් ලෙස ශ්‍රී ලංකා නීතිය පිළිගනියි. අන්තර්ජාලය හරහා වෛරී ප්‍රකාශ වලට අනුබල දෙන පාර්ශ්වයන් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් දැනුවත් කිරීම ඔබට සිදු කළ හැකිය. එමෙන්ම වෛරී ප්‍රකාශන වලට එරෙහිව කටයුතු කරන සංවිධාන වලට මෙවැනි හැසිරීම් පිළිබඳව ඔබට බොහෝ පහසුවෙන් දැනුවත් කළ හැකිය.

එමෙන්ම වෛරී කථාව ඔබේ මානසික යහපැවැත්මට ඍණාත්මක බලපැමක් එක් කලේ නම් හෝ එහි අන්තර්ගතය විසින් පීඩාවට පත් කළ යම් පුද්ගලයෙකු පිළිබඳව ඔබ දන්නේ නම් ඔබට මනෝ සමාජ විශේෂඥයෙකුගේ සහයෝගය ලබා ගත හැකිය.

## 6.5 දැනුවත් කිරීම...

ද්වේශ සහගත ප්‍රකාශනයක් හා ඒවැනි ප්‍රකාශනයන්වල හැසිරීම වැළැක්වීම පිළිබඳව ඔබට දැනුම / තොරතුරු තිබේ නම් ඒ සඳහා ඔබේ සමාජ මාධ්‍ය වේදිකා (FB, Twitter, You Tube, Massenger) භාවිතා කළ හැකිය.







**වෛරී ප්‍රකාශනයක් දුටු විට හෝ මුහුණ දුන් විට**
**නිහඬවන්න එපා......**

# ඔබේ නිහඬ වීම......

## පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම්,

- ප්‍රචණ්ඩත්වය හා හිංසනය වෙත නතු කර ගැනීමක් විය හැකිය.
- ප්‍රචණ්ඩත්වය හිංසනය, මුසුවු ගැටුම් නිර්මාණය කිරීමක් විය හැකිය.
- යම් මතයක් / මතයන් ප්‍රචණ්ඩ සහ වෛරී ලෙස පරිවර්තනය කිරීමේ හැකියාවක් විය හැකිය.
- සමස්ත සමාජයම ප්‍රචණ්ඩත්වය කරා මෙහෙය වීමක්ද විය හැකිය.




ඔබ, දැන් වෛරී ප්‍රකාශන ඇතිවීමට හේතු සහ වෛරී ප්‍රකාශන හඳුනා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් වී ඇත. ඒමෙන්ම වෛරී ප්‍රකාශන කළ හැකි මාධ්‍යයන්, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළ, වෛරී ප්‍රකාශන වල හැසිරීම සහ එවන් ප්‍රකාශනයන් දුටු විට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳවත් ඔබට පුළුල් අවබෝධයක් ලැබී ඇත.

# 7. වෛරී කථනය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

## 7.1 අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා වෛරී ප්‍රකාශන

ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතින් අනුවද දේශීය මූලික අයිතිවාසිකම් ප්‍රතිපාදන අනුවද අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමාවකින් තොරව භාවිතා කළ හැකි අයිතිවාසිකමක් නොවේ. ඒ බැවින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ වෛරී කථනය තහනම් කිරීම අතර පරස්පරතාවයක් නොමැත. තවත් ආකාරයකින් කිවහොත් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය වෛරී කථනය දක්වා දිගුවන අයිතිවාසිකමක් නොවේ.

**සිවිල් හා දේශපාන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (ICCPR)
අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව දැක්වෙන 19වන ව්‍යාවස්ථාව මෙසේය.**

01. බාධාවකින් තොරව ස්වකීය මතය දැරීමට සෑම කෙනෙකුටම අයිතිවාසිකම් ඇත්තේය.

02. සෑම කෙනෙකුටම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස් ඇත්තේය.
දේශ සීමාවන්ගෙන් තොරව තොරතුරු, සෑම අන්දමකට අදහස් වාචිකව, ලිඛිතව හෝ මුද්‍රිතව ද, චිත්‍රවල අකාරයෙන්ද ඒසේ නැතහොත් තමාට කැමති ඕනෑම වෙනත් මාධ්‍යයකින්ද සොයා ගැනීමටද ලැබීමට සහ දැන්වීමට තිබෙන නිදහස මෙම අයිතිවාසිකමට ඇතුළත් විය යුතුය.

**මෙම වගන්තියේ.... දෙවන ඡේදයෙහි ප්‍රතිපාදිත අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම විශේෂ රාජකාරි හා වගකීම හා සම්බන්ධව පවතී. ඒහෙයින් එය ඇතම් සීමා කිරීම් වලට යටත් විය හැකි නමුත් ඒම සීමා කිරීම,**

(අ) අනිත් අයගේ අයිතිවාසිකම් වලට හා කීර්ති නාමයන්ට ගරු කිරීම සඳහා

(ආ) ජාතික ආරක්‍ෂාව හෝ මහජන සාමය හෝ මහජන සෞඛ්‍යය හා සදාචාරය හෝ රැකීම සඳහා නිතියේ ලා විධිවිධාන සලසා ඇත්තාවූද අවශ්‍ය වන්නා වූද ඒවා විය යුතුය.

මේ අනුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සඳහන් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකමද වෛරී කථනයන් දක්වා දිගු නොවන බව පැහැදිලිය.

**අප ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 14වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශනයන් ඇතුළු අදහස් පළ කිරීමේ අයිතිය පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් කර ඇති අතර 15වන ව්‍යවස්ථාවේ ඒ පිළිබඳව සීමාවන් දක්වා තිබේ.**

ඒහි 15(2) ව්‍යවස්ථාව දක්වන්නේ :-

14(1) අ අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ පිළිගෙන ඇති මුලික අයිතිවාසිකම් භූක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාවය තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තුව වරප්‍රසාද අධිකරණයට අපහාස කිරීම අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධ නීතියෙන් කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය.

මේ අනුව අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුලික අයිතිවාසිකම් ලෙස සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියද වෛරී කථනය දක්වා දිගු නොවන බව පැහැදිලිය.



## 7.2 වෛරී කථනය පිටු දකින ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රතිපාදන

### 7.2.1 එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR)

පළමුවරට වෛරී කථනයන් තහනම් කළ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මුතිය වුයේ එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියයි. ඒකී සම්මුතියේ 20 වන ව්‍යවස්ථාව මෙසේ දක්වා සිටියි.

1. යුද්ධය සඳහා කෙරෙන සෑම ප්‍රචාරණයක්ම නීතියෙන් තහනම් කළ යුතුය.

2. වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමටත් සිදුවන ජාතික, වාර්ගික, ආගමික ද්වේෂය පැතිරවීමට නීතියෙන් තහනම් කල යුතුය.

### 7.2.2 සෑම ආකාරයකම වාර්ගික වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (CERD)

සියලුම පාර්ශ්වකාර රාජ්‍යයෝ ඒක් වර්ණයක හෝ ඒක් වාර්ගික සම්භවයක් ඇති මාර්ගයක හෝ පුද්ගලයන් සමුහයක උත්තරීතරභාවය දක්වන අදහස් හෝ න්‍යායන් මත පදනම් හෝ කුමන හෝ ආකාරයක වාර්ගික ද්වේෂය සහ වෙනස් ලෙස සැලකීම වර්ධනය කරන සියලු ප්‍රචාරක කටයුතු සහ සියලුම ආයතන හෙළා දකිනු ලබන අතර, ඒවන් උසි ගැන්වීම් හෝ වෙනස් ලෙස සැලකීමේ ක්‍රියාවන් තුරන් කරලීම සඳහා සැලසුම් කළ ස්ථිර ක්‍රියාමාර්ග ඉක්මනින්ම ක්‍රියාවට නැංවීමට පෙරොන්දු වෙති. මේ සඳහා මානව අයිතිවාසි-කම් පිළිබඳව විශ්ව ප්‍රකාශය ගැබ්ව ඇති ප්‍රතිපත්තීන් සහ මෙම සම්මුතීන් පස් වන වගන්තියේ, විශේෂයෙන්ම විස්තර වන අයිතීන් පිළිබඳ සැලකිලිමත් වන අතර, මේ අතරින්

(අ) වාර්ගික උත්තරීතරභාවය ද්වේෂය මත පදනම් වූ සියලු අදහස් පතුරුවාලීම, වාර්ගිකව වෙනස් ලෙස සැලකීමට උසි ගැන්වීම මෙන්ම වෙනස් වර්ණයක හෝ වාර්ගික සම්භවයකට අයත් වර්ගයක් හෝ පුද්ගලයින් සමුහයකට එරෙහිව හිංසාකාරී ක්‍රියාවන් හෝ එවැන්නකට අනුබල දීම නීතිය මගින් දඩුවම් කළ හැකි වරදක් ලෙස ප්‍රකාශ කෙරෙනු ඇත.

(ආ) වාර්ගිකව වෙනස් ලෙස සැලකීම උසි ගන්වන හා වර්ධනය කෙරෙන සංවිධාන වූ හෝ වෙනස් ආකාරයක ප්‍රචාරක ක්‍රියාවන් හෝ ආයතනයක් තහනම් කිරීමට නීති විරෝධී ලෙස ප්‍රකාශ කිරීමටද එවන් සංවිධානයක හෝ ක්‍රියාවන්හි සහභාගිවීම නීතියෙන් දඬුවම් දිය හැකි වරද ලෙස ද පිළිගැනෙනු ඇත.

(ඇ) ජාතික හෝ දේශීය රාජ්‍ය නිළධාරීන් සහ රාජ්‍ය ආයතන වාර්ගිකව වෙනස් ලෙස සැලකීම උසිගැන්වීම හා වර්ධනය කිරීමට ඉඩ නොතැබෙනු ඇත.

මේ අනුව මෙම සම්මුතිය අපාරානුමත කරන ලද (අත්සන් කර එය අනුගමනය කිරීමට පෙරොන්දු වූ) සාමාජික රාජ්‍යයන් විසින් වෛරී කථනයන් තහනම් කිරීම සඳහා නීති පැනවීමට බැඳී සිටියි.






# ශ්‍රී ලංකාවේ ICCPR ක්‍රියාත්මක වූ අවස්ථා

- නෙළුම් මලක වැඩ සිටින බුදුරුවක් අතේ පච්ච කොටා ගෙන සිටි නයෝමි කෝල්මන් 2014 වර්ෂයේදී බණ්ඩාරනායක අන්තර් ජාතික ගුවන් තොටුපළේදී අත් අඩංගුවට ගත් කටුනායක පොලීසිය කියා සිටියේ, එම පච්චය මහ ජනතාව කුපිත කිරීමට හේතුවක් විය හැකි බැවින් ඇය අත්අඩංගුවට ගත් බවයි.
- පසුගියදා පොල්ගහවෙල ප්‍රදේශයේ භික්ෂූන් පිරිසක් සිදුකළ පැමිණිල්ලකට අනුව සම්මානලාභී ලේඛක ශක්තික සත්කුමාර පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබීය. සිය ෆේස්බුක් ගිණුමේ පළ කරන ලද කෙටි කථාවක අඩංගු කරුණු මහජන කැළඹීමකට හේතු විය හැකි බව ශක්තිකට එරෙහිව චෝදනාවයි.
- 2018 මාර්තු මස දිගන සිදු වූ කලහකාරී සිදුවීම්වලින් පසු මහ සොහොන් බලකායේ අමිත් වීරසිංහ සහ තවත් පුද්ගලයන් දිගු කලක් බන්ධනාගාර ගත වීමද මෙම පනත සහ හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මද වීමෙන් සිදු විය.

**හදිසි නීති මෙන්ම මෙම පනත ක්‍රියාත්මක කිරීමෙන් සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ජන කොටස් වලට අයත් පිරිස වරින් වර ඇති වූ යුද්ධමය තත්වයන් සහ කලහකාරී සිදුවීම් යටතේ අත් අඩංගුවට පත් වී තිබේ.**

- රහිම් මසලනා ඇඟලා සිටි දිගු ගවුමේ පිටුපස ධර්ම චක්‍රයක හැඩයේ සලකුණක් තිබීම හේතුවෙන් හසලක පොලීසිය විසින් ඇය අත් අඩංගුවට ගනු ලැබීය.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ අඩංගු වගන්ති වලින් බලාත්මක වන නීතිය අනුව මෙම අත් අඩංගුවට ගැනීම සිදුවිණි.**





# 8. වෛරී කථනය තහනම් කරන ශ්‍රී ලාංකික නීති

**වෛරී කථනය හා සම්බන්ධ ප්‍රකාශන වැළක්වීම සඳහා ශ්‍රී ලාංකික නීති පද්ධතිය තුළ නීතිමය ප්‍රතිපාදන කිහිපයක් අන්තර්ගත වේ.**

ඒ නම්,

01. 2007 අංක 57 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනත
02. දණ්ඩනීති සංග්‍රහය - 19වන අධිකාරිය
03. පොලිස් ආඥා පනත - 13වන අධිකාරිය
04. 1958 අංක 41 දරණ ආගමික 41 දරණ ආගමික අපහාසකාරී ප්‍රකාශන පනත
05. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදයට වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

## 8.1 2007 අංක 57 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනත

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනතේ 3 (1) වගන්තිය මෙසේ දක්වා ඇත.**

කිසිම තැනැත්තෙකු විසින් යුද්ධය පැතිරවීමට හෝ වෙනස් ලෙස සැලකීමට එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලට යොමුවීම සංයුක්ත කරන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම නොකළ යුතුය.

ඒවැනි වරදක් සිදු කරන පුද්ගලයෙකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි අතර නඩුව අවසන් වන තෙක් ඇප ලබා දීමක් සිදු නොකෙරන අතර සුවිශේෂී හේතූන් මත ඇප ලබා දීමේ බලය මහාධිකරණයට පවතී. ඒවැනි වරදක් සිදු කරන තැනැත්තෙකු සම්බන්ධයෙන් නඩු විභාග කිරීමේ බලය මහාධිකරණයට පවතින අතර වසර 10ක් දක්වා සිර දඬුවම් නියම කළ හැකිය.

## 8.2 දණ්ඩ නීති සංග්‍රහය - 19වන අධිකාරය

දණ්ඩ නීති සංග්‍රහයේ දස වන පරිච්ඡේදය යටතේ වන රාජ්‍ය විරෝධී වැරදි යටතේ වන 120 වගන්තිය දක්වන්නේ කතා කරනු ලැබූ හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචන වලින් හෝ සංඥා වලින් දැකිය හැකි නිරූපණවලින් පිහිටුවනු ලැබූ ලංකා ආණ්ඩුවට විරුද්ධත්වය දැක්වීමේ හැඟීම් ඇවිස්සුවහොත් හෝ ඇවිස්සීමට තැත් කරතොත් හෝ නීතිය ක්‍රියාවෙහි යෙදවීමේදී වෛරයක් හෝ අගෞරවයක් ඇති කරන හොත් හෝ ඇති කරවීමට තැත් කරතොත් හෝ නිත්‍යානුකූල මාර්ග වලින් නොව අන්ලෙසකින් නීතියෙන් පිහිටුවුන ලැබ් යමක් වෙනස් කිරීමට රජතුමාගේ වැසියන් උනන්දු කරවතොත් හෝ රජතුමාගේ වැසියන් අතර අසන්තෝෂය හෝ විරුද්ධත්වය ඇති කරවීමට හෝ ඒබඳු වැසියන්ගේ වෙනත් පන්ති අතර සතුරු වූද, හැඟීම් වැඩි දියුණු කිරීමට තැත් කරතොත් ඔහුට අවුරුදු දෙකක කාලයක් ලිහිල් බන්ධනාගාර ගත කිරීමට කින් දඬුවම් කළ යුතුය.

එසේම දණ්ඩ නීති සංග්‍රහයේ 291 (2) වගන්තියට අනුව ආගමික හැඟීම් කෙලෙසීම සඳහා ඒකාන්ත හා ද්වේශ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණ වලින් ඒකී පන්තියේ ආගමට හෝ ආගමික විශ්වාස වලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන තැනැත්තෙකු වරදක් සිදු කරන අතර අවුරුද්දක් සිර දඬුවම් හෝ / හා දඩයක් මගින් දඬුවම් කළ හැකිය.

ඒසේම දණ්ඩ නීති සංග්‍රහයේ xx වන පරිච්ඡේදය යටතේ සාපරාධී බය ගැන්වීම, නින්දා කිරීම හා අප්‍රසන්නතාවය යටතේ වන වරදක් ලෙස 483 වන වගන්තිය මගින් සාපරාධී බිය ගැන්වීම යන වරද හඳුනාගෙන ඇත. ඒ අනුව තැතිගැන්වීමක් ඇති කරන අදහසින් හෝ තර්ජනය ක්‍රියාත්මක කරවීම වැළක්වීමේ මාර්ගයක් වශයෙන් තමා නීත්‍යානුකූලව කිරීමට බැඳී නැති ක්‍රියාවක් කරවීමට හෝ තමා නීත්‍යානුකූලව කිරීමට බලය ඇති යම් ක්‍රියාවක් නොකර හැරවීමට යමෙකු යම් තැනැත්තෙකුගේ ශරීරයට හෝ දේපළ වලට හෝ ඔහු සම්බන්ධතාවක් දක්වන වෙනත් තැනැත්තෙකුගේ ශරීරයට හෝ කීර්තියට පාඩුවක් කරන බවට තර්ජනය කරතහොත්, ඔහු සාපරාධී බිය ගැන්වීම කරයි යනුවෙන් සඳහන් වේ.



## 8.3 පොලිස් ආඥා පනත - 13 වන අධිකාරිය

පොලිස් ආඥා පනතේ 79(2) වගන්තිය දක්වන්නේ "**සාමය කඩ කිරීමකට කුපිත කිරීමේ අදහස ඇතිව හෝ ඒමගින් සාමය කඩවීමක් විය හැකි තර්ජනාත්මක නින්දා සහගත හෝ අපහාසාත්මක වචන යම් පොදු ස්ථානයකදී හෝ ප්‍රසිද්ධ රැස්වීමකදී යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කරනු ලැබුවහොත් හෝ හැසිරුනහොත් ඔහු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන්නේය**" යනුවෙනි. මෙවැනි වරදකට වරදකරු වූ පුද්ගලයෙකුට රුපියල් 500ක් දක්වා දඩයකට හා / හෝ මාස 06ක් දක්වා සිර දඬුවම් ලබා දිය හැකිය.

## 8.4 1958 අංක 41 දරණ ආගමික අපහසකාරී ප්‍රකාශන පනත

ආගමික අපහාසකාරී පනතේ 2වන වගන්තියට අනුව ආගමික අපහාසකාරී ප්‍රකාශනයක් ලිවීම, නිපදවීම, ප්‍රකාශයට පත් කිරීම, විකිණීම, බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය කිරීම වරදකි. ඒවැනි වරදක් සිදු කරනු ලබන තැනැත්තෙකුට වසරකට සිර දඬුවම් හා රුපියල් 2000ක දඩයක් නියම කළ හැකිය.

## 8.5 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 (අ) (උ) වගන්තිය අනුව

කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් නැතහොත් දුර්චේතනික හෝ වදිර්වාදි හැඟීම ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නාවූ තැනැත්තෙක් වරදක් සිදු කරයි.

එවැනි වරදක් සිදු කරනු ලබන තැනත්තෙකුට වසර 05කට නොවැඩි දෙආකාරයකින් ඒක් ආකාරයකට බන්ධනාගාරගත කිරීම සිදු කරනු ලැබිය හැකිය.

ඒ අනුව ඉහත කී පනත යටතේ අපරාධයක් වන ප්‍රකාශනයන් ජනමාධ්‍ය තුළ පළ කිරීම වරදකි.

# 9. වෛරී කථනය අදාළ නීති සංශෝධනයන් පිළිබඳ උත්සාහයන්

**2015**

2015 වසරේ දණ්ඩ නීති සංග්‍රහය පහත පරිදි සංශෝදනය කිරීමට රජය පනත් කෙටුම්පතක් ගෙන එන ලදී. මෙම පනත් කෙටුම්පත 2015 නොවැම්බර් 09 වන දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළ කරන ලදී. ඒහි අරමුණ වුයේ (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයට අනුව 291 (ඇ) අලුත් වගන්තිය සංශෝදනය කිරීමයි. ඒ අනුව පහත සඳහන් වන පරිදි ඒම වගන්තිය සංශෝදනය කිරීමට යෝජනා කරන ලදී.

201 (ඇ) භාෂිත ලිඛිත හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන්, සංඥා වලින් හෝ දැකිය හැකි නිරූපණ වලින් හෝ අන්‍යාකාරයෙන්, ජන කොටස් අතර හෝ වෙනත් පංතිවල තැනැත්තන් අතර හෝ වෙනස් වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර දරුණු ක්‍රියා හෝ ආගමික වාර්ගික හෝ ජාතික අසමගිය හෝ අසන්තෝෂය හෝ සතුරු බව ඇති කරන හෝ තැත් කරන නැතහොත් ඊට පොළඹවන හෝ තැත් කරන යමෙකුට අවුරුදු දෙකක් දක්වා කාලයකට දෙආකාරයකින් ඒක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

මෙම සංශෝදනය සිදු කිරීම මගින් මුලික අයිතිවාසිකම් සීමා වන බවට චෝදනා කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රේෂඨාධිකරණයේ පෙත්සමක් ගොනු කරන ලදී. (නඩු අංක SCSD application No. 23/15) ඒසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙන්ම සිවිල් සංවිධාන රාශියක් මෙම සංශෝධනය ඉවත් කර ගන්නා ලෙස අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීම් කළ අතර ඒ අනුව පාර්ලිමේන්තුවේදි ඔහු විසින් මෙම සංශෝධනය ඉල්ලා අස්කර ගන්නා ලදී.

**2019**

2019 ජුනි 04වන දින වෛරී ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හැකිවනු පිණිස දණ්ඩ නීති සංග්‍රහය හා අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය අනුමත කරන ලදී. ඒම ජනවාර්ගික කොටස් අතර සාමය සහජීවනය පවත්වාගෙන යාමටත් රාජ්‍ය ආරක්ෂාවටත් බාධාවක් වන ආකාරයේ වෛරී ප්‍රකාශ තහනම් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම අරමුණු විය. නමුත් ඒ පිළිබඳව පනත් කෙටුම්පතක් ඉදිරිපත් නොවීය.




ඔබ, දැන් වෛරී කථනය පිළිබඳ
නීතිමය ප්‍රතිපාදන,
වෛරී කථනය පිටු දකින
ජාත්‍යන්තර මානව හිමිකම්
ප්‍රතිපාදන, වෛරී කථනය තහනම් කරන
ශ්‍රී ලාංකික නීතීන් සහ
නීති සංශෝධනයන් පිළිබඳ
මුලික දැනුමක් ලබාගෙන ඇත,

# 10. වෛරී කථනයට එරෙහිව වීමට ඇති ක්‍රම.....

- මාධ්‍ය ආචාර්යධර්ම පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.
- ගැටුම් සංවේදීව වාර්තාකරණය සහ බහු සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දිරිමත් කළ යුතුය.
- සමාජ මාධ්‍ය නියාමනය කිරීම.
- වෛරී කථන ආශ්‍රිත අපරාධ වාර්තා කිරීමට සුදුසු ආරක්ෂිත ක්‍රමවේද සකස් කිරීම.



## 10.1 වෛරී කථනය අවම කිරීම වෙනුවෙන් අපට කල හැක්කේ කුමක්ද?

■ **සමානාත්මතාව හා විවිධත්වය ගැන කතා කිරීම**

- වෛරී ප්‍රකාශ වලට එරෙහිවීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. ශාරීරික හිරිහැර (සයිබර් අවකාශයේ හිරිහැර කිරීම් සහ වෛරී අපරාධ පිළිබඳව වැඩි වැඩියෙන් ජනතාව දැනුවත් කිරීම හරහා අනාගතයේ වෛරී ප්‍රකාශන භාවිතය අවම කර ගත හැකිය.)

- වෛරී ප්‍රකාශ වලට එරෙහිව අප නැගී සිටිය යුතුය. සංවේදනය හා අනුකම්පාව උපදවන සමාජයක් බිහි කිරීම කළ යුතු අතර එමගින් ජාතිවාදය හා ආගම්වාදය එරෙහිව සටන් කරන සමාජයක් බිහිකළ කිරීම අපගේ අපේක්ෂාව විය යුතුය.

- අප තරයේ මතක තබා ගතයුතු දෙයක් වන්නේ අනෙකාගේ යහ පැවැත්මට හෝ ආත්මාභිමානයට හානියක් සිදුවිය හැකි මෙවන් ප්‍රකාශ අවම කර ගැනීම තුලින් අපට වඩාත් ප්‍රියජනක හා සාමකාමී ජීවිතයක් උදාකර ගත හැකි බවයි.



## 10.2 වෛරී කථනය වෙනුවට ප්‍රතිකථනය

ද්වේශයෙන් යුතු වෛරය පැතිරවෙන අදහස් පුද්ගලයන්ට මෙන්ම සමාජයටද පිළිලයක් බව අපි මීට පෙර අවබෝධ කරගත්තෙමු. වෛරය මැඩීමටද වෙනම විකල්ප ඝනයේ ධනාත්මක අදහස් ඒ ක්‍රම වලටම බෙදා හැරීම අවශ්‍ය බව මේ සම්බන්ධව අන්තර්ජාතික මට්ටමින් කටයුතු කරන විශේෂඥයන්ගේ අදහස වී තිබේ. ඒ සඳහා ප්‍රතිකථනය නමින් සංකල්පයක් හා ක්‍රියාවලියක් ශ්‍රී ලංකාව තුලත් ගොඩ නැගෙමින් පවති.

**ප්‍රතිකථනය කොටස් දෙකකින් යුක්තය.**

1. කාලය වැය කිරීමෙන් සමාජයේ පවතින ගැටලුත් සම්බන්ධව හා ඒ ගැටලුත් නිරාකරණය කිරීම මගින් වෛරී කථනය වැලැක්වීම සඳහා සිදු කරන දීර්ඝ කාලින මැදිහත් වීම.

2. සමාජයේ පැතිරී යන වෛරී කථනයට ක්ෂණිකව දක්වන ප්‍රතිචාරයන්




ප්‍රතිකථනය පිළිබඳ මෙන්ම ප්‍රතිකථන නිර්මාණය කිරීම සඳහා වැඩිදුර තොරතුරු දැනගැනීමට හෑෂ්ටැග් පරපුර විසින් හඳුන්වා දුන් මොඩියුලය සඳහා මේ සබැඳියෙන් පිවිසිය හැකිය.

**- https://hashtaggeneration.org/publications/**










ඔබ, දැන් වෛරී කථාවට එරෙහි වීමේ
ක්‍රම සහ ඒ වෙනුවෙන් ක්‍රියා කළ යුතු
ආකාරය පිළිබඳව පූර්ණ අවබෝධයක්
ලබාගෙන ඇත.



# වැඩිදුර අධ්‍යයනයන් සඳහා.......

Appadurai, Arjun (2006) Fear of Small Numbers: Geography of Anger. Durham: Duke University Press.

Gunatilleke, Gehan. (2018). The Chronic and the Entrenched: Ethno-Religious Violence in Sri Lanka. Colombo: ICES.

Hashtag Generation. (2020). Sri Lanka Social Media and Electoral Integrity: Findings from Sri Lanka's 2020 Parliamentary Election. Colombo: Hashtag Generation.

Laub, Z. (2019) Hate Speech on Social Media: Global Comparisons. Council on International Relations, Background Paper. https://www.cfr.org/backgrounder/hate-speech-social-media-global-comparisons

Liyange, Chamila (2014) Approaching the Extinction of a Race: An Enquiry into Population Trends in Sri Lanka. Colombo: Bodu Bala Sena. (in Sinhala).

Lohani, Archit. (2021) Countering Disinformation and Hate Speech online. New Delhi: Observer R
Samaratunge, Shilpa and Hattotuwa, Sanjana (2014). Liking violence: A study of hate speech on Facebook in Sri Lanka Colombo: Centre for Policy Alternatives.esearch Foundation.

Silva, K.T. (2016) Gossip, Rumor and Propaganda in Anti-Muslim Campaigns of the Bodu Bala Sena in John Holt ed. Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka. Oxford: Oxford University Press, Pp. 117-140.

Silva, K.T. (2020) Identity, Infection and Fear: A Preliminary Analysis of COVID-19 Drivers and Responses in Sri Lanka. Colombo: ICES, 2020. http://ices.lk/publications/identity-infection-and-fear/
Silva, K.T., Mahees, M., Hapuarachchi, I. and Nuhman, M. (2020). Why Reconciliation Matters: An Exploration into Triggers and Underlying Causes of Anti-Muslim Violence in Sri Lanka in the Aftermath of Easter Sunday Attacks. Kandy: Human Development Organization.
Tambiah S.J. (1996) Leveling Crowds: Ethnonationalist Conflicts and Collective Violence in South Asia. Berkeley University Press, California

Hashtag Generation

National Peace Council of Sri Lanka




STOP
HATE
SPEECH